# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1965/3 - 2016 මැයි මස 02 වැනි සඳුදා - 2016.05.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### කෑගල්ල නගර සභා බල ප්‍රදේශය සඳහා සංශෝධිත සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 ''උ'' වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද කෑගල්ල නගර සභා ප්‍රදේශය සඳහා වූ සංශෝධිත සංවර්ධන සැලැස්ම, මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 ''ඊ'' වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2016.04.19 වැනි දින අනුමත කරන ලද බවත්, මෙම *ගැසට් නිවේදනය* පළ වූ දින සිට එය බලපැවැත්වෙන බවත්, මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

රංජිත් ප්‍රනාන්දු,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2016 අප්‍රේල් මස 26 වැනි දින,

### කෑගල්ල නගර සභා බල ප්‍රදේශයෙන් සමන්විත
### කෑගල්ල නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංශෝධිත සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 ''උ'' වගන්තියේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2012.09.05 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශය සැලකිල්ලට ගෙන කෑගල්ල නගර සභා බල ප්‍රදේශයෙන් සංයුක්ත වන කෑගල්ල නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංශෝධිත සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

පාඨලී චම්පික රණවක,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2016 අප්‍රේල් මස 19 වැනි දින,
17 වන මහල,
''සුහුරුපාය'' සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

05 - 448

1A - G 23378 — 46 (2016/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*